සියලු ම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ/ All Rights Reserved

DEPARTMENT OF EDUCATION- CENTRAL PROVINCE DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

மத்திய மாகாண கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස. (උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

කෘෂි විද්‍යාව -1	13 ශ්‍රේණිය	08	S	I	කාලය පැය 02

විභාග අංකය .....


උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4),(5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.

1. දිවිවා සුළි කුණාටුව නිසා ගම්පොළ ප්‍රදේශයේ පිහිටි බෝග වගා භූමියකට සිදු වූ හානි සඳහා වන්දි ලබා ගැනීමට ගොවි මහතෙකු යා යුත්තේ,
   1) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
   2) ගොවිජන සේවා දෙපාර්තුමේන්තුව
   3) පොහොර ලේකම් කාර්යාලය
   3) සමුපකාර දෙපාර්තුමේන්තුව
   5) වාරි මාර්ග දෙපාර්තුමේන්තුව

2. බෝග වගාවකට එක්තරා ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයක් හිඟ වූ විට ඌනතා ලක්ෂණ ළපටි පත්‍ර වල මුලින්ම දක්නට ලැබුණේ නම්, එම ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය විය හැක්කේ,
   1) ක්ලෝරීන් ය.
   2) බෝරෝන් ය.
   3) කැල්සියම් ය.
   4) නයිට්‍රජන් ය.
   5) මැග්නිසියම් ය.

3. අනෙකුත් සම්ප්‍රදායික ජල එසවුම් ක්‍රමවලට සාපේක්ෂව පහත ජල එසවුම් ක්‍රමයේ වාසියක් වනුයේ,



   1) විශාල වගා බිම් සඳහා ජලය යෙදීමට සුදුසු වීම
   2) පරිසර දූෂණය සිදු නොවීම
   3) දවස මුළුල්ලේ ම ක්‍රියාත්මක කිරීමට හැකි වීම
   4) ඉන්ධන වැය නොවීම
   5) මිනිස් ශ්‍රමය භාවිත කර ක්‍රියා කිරීමට හැකි වීම


4. රෝග වලින් තොර රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට වඩාත් සුදුසු ප්‍රචාරණ ක්‍රමය වන්නේ
   1) රිකිළි බද්ධයයි.
   2) බීජ මඟින් ප්‍රචාරණයයි.
   3) ක්ෂුද්‍ර ප්‍රචාරණයයි.
   4) අතු බැඳීමයි.
   5) ක්ලෝනකරණයයි.

5. පසක් නිර්මාණය වන්නේ
   1) පාංශු පැතිකඩේ පහළ සිට ඉහළටය.
   2) පාංශු පැතිකඩේ තිරස් තලය ඔස්සේය.
   3) පාංශු පැතිකඩේ ඉහළ සිට පහළටය.
   4) පාංශු පැතිකඩේ සිරස් තලය පුරා සමාකාරවය.
   5) පාංශු පැතිකඩේ සිරස් තලයේ මෙන් තිරස් තලය ඔස්සේය.

6. බෝග ශාකයක ඵල, රතු පැහැය කහ පැහැයට ප්‍රමුඛ වේ. නියගයට ඔරොත්තු දීමේ හැකියාව, නියගයට ඔරොත්තු නොදීමේ හැකියාවට ප්‍රමුඛ වේ. (පැහැය - A , a ලෙසත් නියගයට ඔරොත්තු දීමේ හා නොදීමේ හැකියාව B, b ලෙසත් සැලකිය යුතුය.) රතු පැහැති ඵල දරන නියගයට ඔරොත්තු දීමේ හැකියාව ඇති විෂමයෝගී ශාකයක් හා කහ පැහැති ඵල දරණ නියගයට ඔරොත්තු දීමේ හැකියාවක් නැති ශාකයක් අතර පරපරාගනයෙන් ලැබුණු F1 පරම්පරාවේ ප්‍රවේණිදර්ශයක් වනුයේ,

1) Aabb 2) AAbb 3) AABB
4) aaBB 5) AaBB

7. පහත දැක්වෙන්නේ නිර්පාංශු වගාව සඳහා බහුලව යොදා ගන්නා වගා ක්‍රමයකි.



මෙම වගා ක්‍රමය විය හැක්කේ,

1) කේෂික අවශෝෂණ වගාව 2) මුල් ගිල්වූ වගාව
3) පාවෙන වගාව 4) ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය
5) නොගැඹුරු පෝෂක ද්‍රාවණ පටල තාක්ෂණය

8. පාංශු විද්‍යාගාර පරීක්ෂණයකදී පිලිවෙලින් ස්ථීර මැලවීමෙන් පසු හා 105 ^{0}C උෂ්ණත්වයක නියත ස්කන්ධයක් ලැබෙන තෙක් රත් කිරීමෙන් පසු ස්කන්ධය පිලිවෙළින් a හා b නම් ස්ථීර මැලවීමේ අංකය වනුයේ,

1) a – b 2) $\frac{a-b}{a}$ 3) $\frac{a-b}{b} X\ 100$ 4) $\frac{b-a}{a} X\ 100$ 5) b – a

9. සයිටොකයිනීන් හෝර්මෝනය මගින් සිදු කරන ප්‍රධාන කාර්යය වන්නේ,

1) පූටිකා වැසීම ය. 2) ඵල ඉදීම ය.
3) පත්‍ර වෘද්ධියතාව පාලනය කිරීමය. 4) පත්‍ර ජේදනය සිදු කිරීම ය.
5) ජායාංගී පුෂ්ප ඇති කිරීම ය.

10. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක පිහිටුවා ඇති තෙත් හා වියළි බලබ පායාංක ඇසුරින් සාපේක්ෂ ආර්ද්‍රතාව මැනීමට යොදා ගන්නා සාපේක්ෂ ආර්ද්‍රතා වගුවේ

1) ඉහළ සිට පහළට සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු වේ.
2) දකුණේ සිට වමට සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වේ.
3) උෂ්ණත්වය වැඩිවත්ම සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු වේ.
4) උෂ්ණත්වමාන පායාංක වෙනස වැඩිවත්ම සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වේ.
5) වමේ සිට දකුණට සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වේ.

11. පහත ප්‍රකාශන සලකන්න

A. වසර පුරා ජලය පැවතීම
B. බැර ලෝහ වලින් තොර ජලය පැවතීම
C. භූගත ජල මට්ටමට පහලින් ජල ප්‍රභවය පිහිටීම
D. ජල ප්‍රභවයේ සිට වගා බිමට ඇති දුර
E. ජල ප්‍රභවය සැකසීමට හ එහි සිට ජලය වගා බිමට ගෙන ඒමට අවශ්‍ය වන පිරිවැය

ඉහත කරුණු අතරින් ජල ප්‍රභවයක් තේරීමේදී සලකා බලන සාධක වනුයේ

1) A, B සහ C පමණි.
2) B, C සහ D පමණි.
3) C, D සහ E පමණි.
4) B, D සහ E පමණි.
5) A, C සහ D පමණි.

12. පාලිත පරිසර තත්ව ලබා දෙමින් සිදුකරන බෝග වගාවන් සඳහා 'හරිතාගාර' ශ්‍රී ලංකාවේ යොදා නොගැනීමට ප්‍රධාන හේතුව ඒ සඳහා අධික වියදම් දැරීමට සිදුවීම සහ ඉහල තාක්ෂණයක් යොදා ගැනීමයි. නමුත් හරිතාගාර ලංකාවේ යොදා ගන්නේ නම් ඒ සඳහා වඩාත් සුදුසු ප්‍රදේශය වනුයේ,

1) මහනුවර
2) නුවරඑළිය
3) මාතර
4) අනුරාධපුර
5)කුරුණෑගල

13. ප්‍රාථමික බිම්සැකසීමේ දී යොදා ගන්නා රෝද දෙකේ ට්‍රැක්ටරයට සම්බන්ධ කරන උපකරණයක් වනුයේ,

1) කොකු නගුල
2) රොටවේටරය
3) තැටි නගුල
4) ජපන් පරිවර්ත්‍ය නගුල
5) ජපන් රොටරි විඩරය

14. කාලගුණික මධ්‍යස්ථානයක වාශ්පීකරණ තැටියේ පෙර දින පාඨාංකය මි.මී.16 කි පසු දින පාඨාංකය මි.මී. 24 විය. එදිනට අදාල වර්ෂාපතනය මි.මී.9 ක් නම් වාශ්පීකරණ ප්‍රමාණය විය හැක්කේ,

1) මි.මී.8 කි.
2) මි.මී.17 කි.
3) මි.මී.15 කි.
4) මි.මී. 7 කි.
5) මි.මී.1 කි.

15. පසක සත්‍ය ඝනත්වය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. පාංශු වයනය අනුව සත්‍ය ඝනත්වය වෙනස් වේ.
B. සවිවරතාවය මත සත්‍ය ඝනත්වය වෙනස් වේ.
C. පස තද වී ඇති ප්‍රමාණය මත සත්‍ය ඝනත්වය වෙනස් වේ.


ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ


1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A හා C පමණි.
5) A හා B පමණි.


16. බහුවාර්ෂික පළතුරු බෝග සඳහා යොදා ගත හැකි වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමය වනුයේ,


1) තීරු ජලසම්පාදනය
2) බෙසම් ජල සම්පාදනය
3) ඇලි හා වැටි ජල සම්පාදනය
4) උප පෘෂ්ඨීය ජලසම්පාදනය
5) බිංදු ජලසම්පාදනය


17. වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් සාන්ද්‍රණය හා ප්‍රභාසංස්ලේෂණය සීඝ්‍රතාව අතර සම්බන්ධතාව නිවැරදිව දැක්වෙන්නේ,

1)



2)


3)


4)


5)


18. පහත දක්වා රූපසටහනේ දක්වා ඇත්තේ බහුලව යොදා ගන්නා බද්ධ ක්‍රමයකි.



මෙම බද්ධ ක්‍රමය විය හැක්කේ

1) ජිව්හා බිද්ධය
2) ආරුක්කු බද්ධය
3) පැලුම් රිකිළි බද්ධය
4) රිකිලි බද්ධය
5) හරිත බද්ධය

19. පොහොර මිශ්‍රණ සැකසීමේදී පුරක ද්‍රව්‍ය එක් කිරීමේ අරමුණු වන්නේ,

1) පොහොර වල ද්‍රාව්‍යතාව වැඩි කිරීමයි.
2) මූලද්‍රව්‍ය පාංශු ද්‍රාවණයට නිදහස් කිරීම පහසු කිරීමයි.
3) ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කිරීමයි.
4) පොහොර මිශ්‍රණයෙහි අදාල ස්කන්ධය සම්පූර්ණ කිරීමයි.
5) ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය පාලනය කිරීමයි.

20. පස් නියදියක භුවමාරු කළ හැකි මුළු කැටායන ප්‍රමාණය 12.5meq/100g වන අතර H+ හා Al +3 ප්‍රමාණය 2.5 meq/100g වේ.එම පසේ භෂ්ම සංතෘප්තිය වනුයේ

1) 10 meq/100g 2) 20.8 meq/100g 3) 80 meq/100
4) 20% 5) 80%

21. පලිබෝධනාශක ක්ෂේත්‍රයට යෙදීම සම්බන්ධව ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.

A. පලිබෝධනාශකය ඉසීමට පෙර ද්‍රාවණය පිලියෙල කර උපකරණයට පුරවා එහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කල යුතුය.
B. පලිබෝධනාශක ඉසින විට සුළං හමන දිශාවට ලම්බකව ඉසින පුද්ගලයා ඉදිරියට ගමන් කරමින් යෙදිය යුතුය.
C. වැසි සහිත දිනවල පලිබෝධනාශක යොදන්නේ නම් එහි සාන්ද්‍රණය වැඩි කර යෙදිය යුතුය.
D. පලිබෝධනාශක ඉසීමෙන් පසු ඉසින උපකරණ සෝදා එම ජලය වලකට දැමීම කල යුතුය.

ඉහත ප්‍රකාශ වලින් ආරක්ෂිතව පලිබෝධනාශක ඉසීම සඳහා භාවිත කල යුතු පිලිවෙත් වනුයේ

1) A සහ B පමණි. 2) A සහ D පමණි. 3) B සහ C පමණි.
4) B සහ D පමණි. 5) C සහ D පමණි.

22. අන්ත උපරිම නොවන පලතුරු වල ලක්ෂණයක් වනුයේ

1) නෙළු පසු ස්වසන වේගය දිගටම අඩු වේ.
2) නෙළු පසු ඉක්මනින් ඉදීමට ලක් වේ.
3) ඉදීම සඳහා වැඩි එතිලින් ප්‍රමාණයක් අවශ්‍ය වේ.
4) ඉදීමට පෙර පලතුරු වල වර්ණය වෙනස් වේ.
5) පලතුරු තුල පිෂ්ඨය සංචිත වී ඇත.

23. තම පාසල් ගෙවත්තේ බෝග වල සිටින පලිබෝධකයින් අධ්‍යයනය කරන සිසුන් පිරිසක් එහි සිටි කෘමි පලිබෝධකයකුගේ ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.

‘ වැටකොළු ශාකයේ පත්‍ර වල නාරටි ඉතිරි කර කා දැමීම නිසා දැලක් සේ ඒවා දිස්වෙන අතර එහි සිටින සුහුඹුලන් හා කීටයන් යන දෙදෙනාම පත්‍ර කා දැමීම සිදු කරයි.’

ඉහත විස්තරයට අනුව එම කෘමි පලිබෝධකයා පිළිබඳ නිවැරදි වනුයේ,

1) ලෙපිඩොප්ටෙරා ගෝත්‍රයට අයත් කහපුරුක් පණුවන් වේ.
2) කෝලියොප්ටෙරා ගෝත්‍රයට අයත් එපිලැක්නා වේ.
3) ඩිප්ටෙරා ගෝත්‍රයට අයත් ඉල් මැස්සා වේ.
4) හෝමොප්ටෙරා ගෝත්‍රයට අයත් කුඩිත්තන් වේ.
5) හෙමිප්ටෙරා ගෝත්‍රයට අයත් කොළ පැහැනි පස් මුළු මකුණන් වේ.

24. තවාන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) නැගෙනහිර බටහිර දිශාවට තවාන් සකස් කිරීමෙන් දවස පුරාම හිරු එළිය පැළ වලට ලබා දිය හැකිය.
2) හලාගත් මතුපිට පස් හ වැලි මිශ්‍ර කර තවාන් මිශ්‍රණය සකසා ගනියි.
3) උණු ජලය යෙදීමෙන් තවාන පීවානුහරණය කල හැකිය.
4) තවාන් පාත්තියේ පළල 90cm විය යුතු අතර දිග අවශ්‍ය ප්‍රමාණයට ගත හැකිය.
5) මිරිස්, බටු, තක්කාලි සඳහා නොරිඩෝකෝ තවාන භාවිත කරයි.

PAST PAPERS WIKI

25. වර්ෂා ජලය මගින් සිදු වන පාංශු ඛාදනයේ ආරම්භක අවස්ථාව වනුයේ
1) ජලය පස මත එකතු වීමේ ක්‍රියාවලියයි. 2) ස්ථිරිය ඛාදන ක්‍රියාවලියයි.
3) ඇලි ඛාදන ක්‍රියාවලියයි. 4) විසිරි ඛාදන ක්‍රියාවලියයි.
5) ජලය පස මත ගමන් කිරීමේ ක්‍රියාවලියයි.

26. පහත ලක්ෂණ සලකන්න
A. පත්‍ර කහ පැහැ වීම.
B. බද්ධ සන්ධිය ඉදිමීම.
C. පරිණත පත්‍ර හැලී යාම.
D. කුරු ශාක හට ගැනීම.
ඉහත ලක්ෂණ අතරින් බද්ධ අසංගතියකදී දක්නට ලැබෙන ලක්ෂණ වන්නේ,
1) A, B සහ C ය. 2) A, B සහ D ය. 3) A, C සහ D ය.
4) B, C සහ D ය. 5) සියල්ලම ය.

27. ක්ෂුද්‍ර ජීවීන් මගින් ආහාර රසායනිකව හා භෞතික විපර්යාසයන්ට ලක් කර නරක් කිරීම සිදු කරයි. මෙහිදී කාබෝහයිඩ්‍රේට්මය ආහාර නරක් කිරීමට හේතු වන ක්ෂුද්‍ර ජීවීන් කාණ්ඩය වනුයේ,
1) ලිපෝලිටික ක්ෂුද්‍ර ජීවීන් 2) සැකරොලිටික ක්ෂුද්‍ර ජීවීන්
3) නයිට්‍රිහාරී ක්ෂුද්‍ර ජීවීන් 4) ප්‍රෝටියෝලිටික ක්ෂුද්‍ර ජීවීන්
5) මෘතෝපජීවී ක්ෂුද්‍ර ජීවීන්

28. ශාක වල පැවැත්මට බීජ වැදගත් වන්නේ ඒවායේ ඇති,
1) ව්‍යාප්ත වීමේ හැකියාව හා තද බීජාවරණයක් තිබීමයි.
2) දීර්ඝ සුප්ත අවධිය හා අභිතකර තත්ව මග හරවා ගැනීමේ හැකියාවයි.
3) හැඩය, තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලයයි.
4) ව්‍යාප්ත වීමේ හැකියාව හා අභිතකර තත්ත්ව මග හරවා ගැනීමේ හැකියාවයි.
5) තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලයයි.

29. පටක රෝපණ මාධ්‍යයක් සැකසීමෙන් පසු පීඩන තාපකයක හෝ පීඩන උඳුනක තබා අධික උෂ්ණත්වයට භාජනය කරනු ලබේ. මෙහි අරමුණ වන්නේ.
1) පොලිසැකරයිඩ, මොනොසැකරයිඩ බවට පත් කිරීමයි.
2) මාධ්‍යය ජීවණුහරණය කිරීමයි.
3) හෝර්මෝන සක්‍රිය කිරීමයි.
4) ඒගාර් සන තත්වයට පත් කිරීමයි.
5) මාධ්‍යයේ ඇති කාබනික පෝෂක ද්‍රාව්‍ය තත්වයට පත් කිරීමයි.

30. ශෂ්‍ය මාරු ගොවිතැනේ දී එකම ක්ෂේත්‍රයේ කන්නයෙන් කන්නයට බෝග මාරු කරමින් බෝග වගා කිරීම සිදු කරයි. මෙහිදී ධාන්‍ය බෝගයකට පසුව රනිල බෝගයක් සිටුවන්නේ,
1) නයිට්‍රජන් අවශ්‍යතාව අධික බෝගයකට පසු නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය කළ හැකි බෝගයක් වගා කිරීමටයි.
2) පසේ ගැඹුරු ස්තර වලින් පෝෂක අවශෝෂණය කළ හැකි බෝගයකට පසු නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය කල හැකි බෝගයක් වගා කිරීමටයි.
3) අස්වනු නෙළීමේදී පස බුරුල් කරන බෝගයකට පසු නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය කරන බෝගයක් වගා කිරීමටයි.
4) පොස්පරස් අවශ්‍යතාව අධික බෝගයකට පසු නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය කරන බෝගයක් වගා කිරීමටයි.
5) පසේ ව්‍යුහය දියුණු කරන බෝගයකට පසු නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය කරන බෝගයක් වගා කිරීමටයි.

31. ආහාර පරිරක්ෂණ ක්‍රමයක් ලෙස ශීත වියලීම යොදා ගන්නා ආහාරයක් වනුයේ
1) කිරි 2) පලතුරු 3) දෙහි
4) මස් 5) බිත්තර

32. ලෝක සෞඛ්‍ය සංවිධානය පළිබෝධනාශක විෂ සහිත බව අනුව ලේබලයේ පහල දාරය වර්ණ ගන්වා ඇත. ඒ අනුව පහත නොගැලපෙන වර්ණය අඩංගු වන්නේ
1) ඉතා උග්‍ර විෂ සහිත පළිබෝධනාශක ලේබලයේ පහල දාරය රතු පැහැති වේ.
2) උග්‍ර විෂ සහිත පළිබෝධනාශක ලේබලයේ පහල දාරය කොළ පැහැති වේ.
3) මධ්‍යම විෂ සහිත පළිබෝධනාශක ලේබලයේ පහල දාරය කහ පැහැති වේ.
4) අඩු විෂ සහිත පළිබෝධනාශක ලේබලයේ පහල දාරය නිල් පැහැති වේ.
5) ඉතා අඩු විෂ සහිත පළිබෝධනාශක ලේබලයේ පහල දාරය සුදු පැහැති වේ.

33. ශාක රෝග කාරකයන් නිසා ඇති වන පොදු රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. පිලිස්සුම් රිෂ්ට
B. මුදු ලප
C. විවිත්‍රය
D. රැළි ගැසී කොඩ වීම.
මෙම රෝග කාරකයා විය හැක්කේ,
1) වෛරස් 2) බැක්ටීරියා 3) දිලීර 4) නෙමටෝඩා 5) පයිටොප්ලාස්මා

34. ශ්‍රී ලංකාවේ සත්ව පාලන කලාප අතුරින් වර්තමානයේ වැඩිම ගව පාලනය සිදු කරන කලාපය සහ වැඩිම කිරි නිෂ්පාදන විභවයක් සහිත කලාපය පිලිවෙලින් සඳහන් වන්නේ
1) වියලි කලාපය සහ පොල් ත්‍රිකෝණය
2) වියලි කලාපය සහ උඩරට කලාපය
3) පොල් ත්‍රිකෝණය සහ උඩරට කලාපය
4) පොල් ත්‍රිකෝණය සහ වියලි කලාපය
5) උඩරට කලාපය සහ වියලි කලාපය

35. මස් සඳහා බ්‍රොයිලර් සතුන් ඇති කරන ගොවිපොළක බ්‍රොයිලර් සතුන් 100ක් සඳහා ආරම්භක සලාකය ලෙස 180Kg ලබා දෙන ලදි. දින 20ක් අවසානයේ එක් බ්‍රොයිලර් සතෙකුගේ දේහ බර 1.2Kg විය. එම අවස්ථාවේ බ්‍රොයිලර් සතුන්ගේ ආහාර පරිවර්තන අනුපාතය (FCR) සොයන්න.
1) 1.3 2) 1.5 3) 1.8 4) 2.0 5) 2.5

36. සත්ව රෝග සම්බන්ධ ප්‍රකාශන අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ
1) කුකුලන්ට වැළදෙන කොක්සිඩියෝසිස් රෝගය වෛරස් රෝගී තත්වයකි.
2) ගව දෙනුන්ට වැළදෙන කිරි උණ රෝගය බැක්ටීරියා රෝගී තත්වයකි.
3) කුකුලන්ට වැළදෙන පුල්ලෝරම් රෝගය ප්‍රෝටසෝවාවෙක් නිසා ඇති වන රෝගී තත්වයකි.
4) ගවයන්ට වැළදෙන කුර හා මුඛ රෝගය සඳහා වෛරස් රෝගී තත්වයකි.
5) කිරි දෙනුන්ට ඇති වන බුරුලු ප්‍රදාහය බහුලව ඇති වන බෝ නොවන රෝගී තත්වයකි.

37. ආහාර නිෂ්පාදනය සෞඛ්‍යාරක්ෂිතව හා උසස් තත්වයෙන් නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදනාගාරය තුල අවශ්‍යතා සපුරාගන්නා බව සහතික කිරීමට යොදා ගන්නා ප්‍රමිතිය වනුයේ
1) ISO ප්‍රමිති සහතිකය 2) SLS ප්‍රමිති සහතිකය
3) HACCP ප්‍රමිති සහතිකය 4) GAP ප්‍රමිති සහතිකය
5) GMP ප්‍රමිති සහතිකය

38. ගව දෙනක් 'වියළි කිරීම' අදාලව ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ.

A. කිරි ලබාගන්නා සියලුම දෙනුන් වියලි කිරීමට ලක් කරයි.

B. ගැබ් දෙනකුගේ වියලි කාලය ආසන්නව මාස 3කි.

C. වියලි කාලයේදී සාන්ද්‍ර අහාර 10% කින් වැඩි කල යුතුය.

ඉහත ප්‍රකාශන අතුරින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

1) A පමණි. 2) B පමණි. 3) C පමණි.

4) A හා C පමණි. 5) B හා C පමණි.

39. පහත රූපසටහනේ දැක්වෙනුයේ බෝග වගා පද්ධතියකි. මෙම බෝග වගාව



1) වීදි බෝග වගාවකි.
2) අතුරු බෝග වගාවකි.
3) බහු ස්තර බෝග වගාවකි.
4) කඩින් කඩ බෝග වගාවකි.
5) මිශ්‍ර බෝග වගාවකි.

40. කෘෂි ක්ෂේත්‍ර වල භාවිත වන ශබ්දය හා අධික කම්පනය ඇති කරන උපකරණ සම්බන්ධ වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A. ගෙවී ගිය, කැඩුණු හෝ ලිහිල් කොටස් අලුත්වැඩිය කිරීම

B. එම යන්ත්‍ර ගමන් ගන්නා භූමියේ රළු බව අඩු කිරීම

C. ක්‍රියාත්මක කිරීමට නිසි පුහුණු ශ්‍රමිකයන් යෙදීම

D. ස්නේහක යෙදීම

එම උපකරණ වලින් ඇති විය හැකි ආපදා අවම කිරීමට ගත හැකි උපාය මාර්ග වන්නේ,

1) A සහ B ය. 2) A සහ C ය. 3) A සහ D ය.

4) B සහ C ය. 5) C සහ D ය.

41. පලිබෝධනාශක ඉසීම සඳහා භාවිත කරන දියර ඉසින යන්ත්‍ර පිළිබඳ නිවැරදි වගන්ති වන්නේ

1) අති -අව පරිමා දියර ඉසින යන්ත්‍ර ඉතා කුඩා ජල බිඳිති සාදන බැවින් මිහිදුම් ජල ඉස්නා ලෙස භාවිත කරයි.

2) බලවේග දියර ඉසිනයක පිටවන රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය පාලනය කරනුයේ ත්වරණ ලීවරය මගින් එංජිමේ වේගය අඩු වැඩි කිරීම මගිනි.

3) නැප්සැක් දියර ඉසිනයක පීඩන කුටීරය තුලට දියර පීඩනය නොවීමට හේතු විය හැක්කේ නැසිල්ල තුල හෝ ට්‍රිගර් කපාටයේ අපද්‍රව්‍ය බැදි තිබීමයි.

4) බලවේග දියර ඉසින යන්ත්‍රට පලිබෝධනාශක දියර පිරවීමට පෙර ඒවා බාල්දියක දියකර රසායනික ද්‍රව්‍ය දමන ටැංකියට පිරවිය යුතුය.

5) නැප්සැක් දියර ඉසිනයක පිටවන රසායනික ද්‍රව්‍ය වල බිඳිති වල ප්‍රමාණය පාලනය කරනුයේ එහි ට්‍රිගර් කපාටය මගිනි.

42. වර්තමානයේ උසස් නිෂ්පාදන ලබා ගැනීමේ අරමුණින් කුකුල් වරිග ආශ්‍රිත වාණිජ දෙමුහුම් නිපදවා ඇත. ශ්‍රී ලංකාවේ මෙම දෙමුහුම් වරිග අතුරින් අති කරනු ලබන බ්‍රොයිලර් දෙමුහුමක් වනුයේ

1) හයිබ්‍රෝ 2) හයිලයින් වයිට්

3) ෂේවර් 288 4) ගෝල්ඩන් කොමැට්

5) ලෝමාන් බ්‍රවුන්

43. සතුන් වැඩිදියුණු කිරීම සම්බන්ධව පහත ප්‍රකාශන සලකන්න

A. දෙමුහුම් අභිජනනයේදී දෙමුහුම් දිරිය ඇති වනුයේ ජාන සමයෝගිතාව වැඩි වීම හේතුවෙනි.
B. අභිජනනයේදී පරම්පරා අන්තරය වැඩි සතුන් විශේෂ සඳහා වරණය ඵලදායි නොවේ.
C. AMZ ගව වර්ගය දෙමුහුම් අභිජනනය යටතේ වැඩි දියුණු කල ගව වර්ගයකි.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වන්නෙ

1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A සහ C පමණි 5) B සහ C පමණි.

44. කුඩා පරිමාණ ගව පාලනයේ යෙදෙන ගොවි මහතෙකු තම සතුන් සඳහා ගව ගාල අවට දල ආහාර වගා කිරීමට අදහස් කලේ නම් ඔහුට ඒ සඳහා වඩාත් සුදුසු ගෝචර තෘණ වර්ගයක් සහ පෝෂ්‍ය රනිල වර්ගයක් පිලිවෙලින් සඳහන් වනුයේ

1) බ්‍රැකේරියා සහ ග්ලිරිසිඩියා 2) සෙටේරියා සහ පියුරේරියා
3) නේපියර් සහ ලියුසීනා 4) බ්‍රැකේරියා සහ සෙන්ට්‍රොසීමා
5) නේපියර් සහ ග්ලිරිසිඩියා


45. පහත වගන්ති සලකන්න

A. භාණ්ඩ සමජාතීය වීම.
B. එක් නිෂ්පාදකයකු පමණක් සිටීම.
C. අධි ප්‍රමාණික ලාභ අබාණ්ඩව ලැබීම.
D. පැවරුණු මිලක් යටතේ ක්‍රියාත්මක වීම.
E. වෙළඳපොල ප්‍රවේශයට බාධා පැවතීම.

පූර්ණ තරගකාරී වෙළඳපොලක දැකිය හැකි ලක්ෂණ වනුයේ,

1) A සහ B පමණි. 2) B සහ E පමණි. 3) A සහ D පමණි.
4) B, C සහ D පමණි. 5) B, D සහ E පමණි

46.



පාරිභෝගිකයෙක් A සිට A' දක්වා වෙනස් වීමට හේතු වන්නේ,

1) ආදායම අඩු වීම.
2) ආදේශක භාණ්ඩ වල මිල වැඩි වීම.
3) රුචිය වැඩි වීම.
4) භාණ්ඩයේ මිල අඩුවීම.
5) අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම.

47. තිරිඟු පිටි සඳහා වෙළඳපොල ඉල්ලුම හා සැපයුම පහත ශ්‍රිත මඟින් දැක්වේ.

$Q_{dx} = 100 - 3P_x$

$Q_{sx} = 5P_x - 60$

සමතුලිත අවස්ථාවේ මිල හා ප්‍රමාණය වනුයේ, පිළිවෙලින්

1) 20, 50 2) 50, 20 3) 20, 40 4) 30, 100 5) 40, 120

48. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාවයේදී ලාභය උපරිම වන අවස්ථාවේදී,

1) ආන්තික වියදම, ආන්තික ආදායමට සමාන වේ.
2) ආන්තික ආදායම, ආන්තික නිෂ්පාදනයට සමාන වේ.
3) ආන්තික ශිල්පීය ආදේශන අනුපාතය, සාධක අතර මිල අනුපාතයට සමාන වේ.
4) ආන්තික ආදේශන අනුපාතය, ආදායම් වක්‍රයේ බෑවුමට සමාන වේ.
5) ආන්තික නිෂ්පාදනය, සාධක අතර මිල අනුපාතයට සමාන වේ.

49. කළමණාකරණය සාර්ථකව සිදු කිරීමට පහත ක්‍රියාවලි සිදු කල යුතු අනුපිලිවෙල වන්නෙ,

A - සංවිධානය B - පාලනය
C- සැලසුම්කරණය D - මෙහෙයවීම

1) A, B, C, D 2) A, C, B, D
3) D, C, B, A 4) C, B, A, D
5) C, A, D, B

50. වර්තමානයේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ව ඇති වන ගැටලු අවම කිරීම හා එම ගැටලු වලට මුහුණ දෙමින් බෝග වගාවේ යෙදීම සඳහා විවිධ කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරයි.
'දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත්' (CSA) හි ප්‍රධාන අරමුණ වන්නේ බෝග ඵලදායිතාව වැඩි කිරීම, දේශගුණයන්ට අනුවර්තනය වීම හා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම වේ.
පහත ප්‍රකාශන සලකන්න

A. බිංදු, විසිරි වැනි ජල සම්පාදන ක්‍රම භාවිත කිරීම
B. වැසි ජලය රැස් කිරීම
C. කාණු ඉදිකිරීම මඟින් ජලවහනය වැඩි දියුණු කිරීම
D. සූර්ය බලය යෝදා ජලය එසවීම සිදු කිරීම
E. ශාක වර්ධනය වේගවත් කිරීම සඳහා පොහොර භාවිතය වැඩිකිරීම

මේවා අතුරින් දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් පමණක් අඩංගු වන්නේ

1) A, B සහ C පමණි. 2) A, Bසහ D පමණි 3) A, Cසහ D පමණි
2) A, D සහ E පමණි 4) A, D සහ E පමණි

සියලු ම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

மத்திய மாகாண கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස. (උ/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

කෘෂි විද්‍යාව -II	13 ශ්‍රේණිය	08	S	II	කාලය පැය 03

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

විභාග අංකය .....

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් - ප්‍රශ්න පත්‍රය A, B කොටස් දෙකකින් සමන්විත වන අතර කොටස් දෙකටම නියමිත කාලය පැය 3 කි.

A කොටස - ව්‍යුහගත රචනා

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බවද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බවද සලකන්න.

B කොටස - රචනා

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A,B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

කොටස	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
A	1	
	2	
	3	
	4	
B	5	
	6	
	7	
	8	
	9	
	10	
එකතුව		

I කොටස	
II කොටස	
එකතුව	

A කොටස - ව්‍යුහගත රචනා

01. A) අතීත ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂිකර්මාන්තය පැවති අතර කාලය සමග විවිධ වෙනස්කම්වලට කෘෂිකර්මාන්තය භාජනය විය.

I. වර්තමාන ශ්‍රී ලංකාවේ දැකිය හැකි කෘෂිකර්මාන්තය කෙසේ හඳුන්වයිද? (1x3)

.....

II. සාම්ප්‍රදායික බෝග හැරුණුවිට වර්තමානයේ වැඩිපුරම අපනයනය කරන බෝග කාණ්ඩය කුමක්ද? (1x3)

.....

III. ශ්‍රී ලංකාවේ වගා කරන බෝගයකට අදාලව පහත වගුව සම්පූර්ණ කරන්න (4x2)

a) බෝගය	
b) ප්‍රධාන නිෂ්පාදනය	
c) අතුරු නිෂ්පාදනය	
d) ප්‍රධාන යෙදවුම්	

B) පස හා සම්බන්ධ පහත වගන්ති නිවැරදි නම් (√) ද වැරදි නම් (X) සලකුණ ද යොදන්න (5x3)

I. ආතනිමානය මගින් පාංශු දෘශ්‍ය ඝනත්වය පිළිබඳ අදහසක් ලබාගත හැකිය. ( )
II. දියසිඳු පස ශ්‍රී ලංකාවේ දෙවෙනියට බහුලම පස් කාණ්ඩයයි. ( )
III. සෞඛ්‍යමත් පසක කාබනික ද්‍රව්‍ය 10% පැවතිය යුතුය. ( )
IV. ගල්ඔය ප්‍රදේශයේ වූර්ණමය නොවන දුඹුරු පස් බහුලව පවතී. ( )
V. කාබනික ද්‍රව්‍ය ජීර්ණයේ දී ප්‍රධානම කාර්යභාරය බැක්ටීරියා මගින් සිදු කරයි. ( )

C) බෝග වගාවේදී ජෛව පොහොර භාවිතය කෘෂි ක්ෂේත්‍රය තුල ප්‍රචලිත වෙමින් පවතියි.

I. ජෛව පොහොර භාවිතයේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න(3X3)

1. .....
2. .....
3. .....

II. පහත දැක්වෙන නයිට්‍රජන් තිරකරන ජෛව පොහොර නිපදවන ක්ෂුද්‍රජීවියකු බැගින් නම් කරන්න(4X2)

a) නීල හරිත ඇල්ගී
   1. සහජීවී ආකාර.....
   2. නිදහස් ආකාර .....

b) බැක්ටීරියා
   1. සහජීවී ආකාර .....
   2. නිදහස් ආකාර .....

III. පොස්පරස් ද්‍රාව්‍යතාව වැඩි කරන ජෛව පොහොර පස තුල එම කාර්යය සිදු කරන ආකාරය සඳහන් කරන්න(1X3)

.....

D) රසායනික පොහොර යෙදීම බෝග අස්වැන්න වැඩි වීමට හේතු වුවද පාරිසරික වශයෙන් හානිදායක විය හැක.

I. අනිසි ලෙස රසායනික පොහොර භාවිතයෙන් බෝග වලට ඇතිකරන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න(2X3)

1. .....

2. .....

II. අනිසි ලෙස රසායනික පොහොර භාවිතය නිසා පරිසරයට හා පසට ඇතිකරන බලපෑම් දෙකක් සඳහන් කරන්න (2X3)

1. .....

2. .....

E) ප්‍රභාසංස්ලේෂණය යනු පෘථිවිය මත ජීවයේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වන ශාක තුල සිදුවන සංසිද්ධියකි.

I. ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය තුලිත රසායනික සමීකරණයකින් ඉදිරිපත් කරන්න(1X4)

II. ශාකයක ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන අභ්‍යන්තර සාධක දෙකක් නම් කරන්න (2X2)

1. .....

2. .....

III. බෝග වගාවේදී කාර්යක්ෂම ලෙස ප්‍රභාසංස්ලේෂණය සිදු කර අස්වනු වැඩි කර ගැනීමට ගත හැකි උපායමාර්ග දෙකක් සඳහන් කරන්න(2X2)

1. .....

2. .....

F) ගොවි මහතෙකුට තමාගේ ආරක්ෂිත ව්‍යුහය තුල වාණිජ වශයෙන් කැපුම් මල් වගාවක් ආරම්භ කිරීම සඳහා රෝගවලින් තොර එකම ප්‍රමාණයේ උසස් ප්‍රභේදයක කාන්ෂන් මල් පැළ විශාල ප්‍රමාණයක් කෙටි කාලයකින් ලබාගැනීමට අවශ්‍ය විය.

I. මේ සඳහා ගොවි මහතා භාවිතයට කිරීමට වඩාත් සුදුසු ප්‍රචාරණ තාක්ෂණ ක්‍රමය කුමක්ද? (1X3)

.....


II. ඔහු ඒ සඳහා ප්‍රරෝහ අග්‍ර යොදා ගන්නේ නම් ඊට හේතුව විය හැක්කේ කුමක්ද? (1X3)


.....

III. ශ්‍රී ලංකාවේ මෙම ප්‍රචාරණ තාක්ෂණ ක්‍රමය යොදා ගනිමින් පැළ ලබා ගන්නා ආහාර බෝගයක් නම් කරන්න (1X3)

.....

G) ශාක ප්‍රවාරණය සඳහා විවිධ ස්භාවික ප්‍රවාරණ ව්‍යුහ යොදා ගනියි. පහත රූප වල දැක්වෙන ප්‍රවාරණ ව්‍යුහ නම් කරන්න (2X3)





1..... 2.....

H) බෝග අස්වනු වල ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට ප්‍රවේණි විද්‍යාවේ දැනුම යොදා ගනියි.

I. විකෘති අභිජනනය සිදු කරන ආකාර දෙක සඳහන් කරන්න(2X3)

1.....

2.....


II. ප්‍රවේණි විද්‍යාවේදී යොදා ගන්නා 'ජෛව තාක්ෂණය' යන්න හඳුන්වන්න (1X4)

.....

.....

02. A) පහත දක්වා ඇත්තේ කාලගුණික දත්ත ලබා ගැනීමට යොදා ගන්නා උපකරණ කිහිපයකි.

A




B



C



D



I. C උපකරණයේ භාවිතයන් දෙකක් සඳහන් කරන්න (2X3)


1.....

2.....

II. A උපකරණයේ හා D උපකරණයේ පාඨාංක අතර කෙබඳු සම්බන්ධතාවක් පවතීද? (1X3)

.....

III. ඉහත සඳහන් සම්බන්ධතාව පහත ප්‍රස්ථාරයේ ඇඳ පෙන්වන්න. (1X3)



IV. කාලගුණික උපකරණ මගින් ලබා ගන්නා දත්ත වල සම්මත ඒකක කිහිපයක් පහත දැක්වේ. එම ඒකක ලබා ගන්නා උපකරණයක් නම් කරන්න (2X4)

ඒකකය	උපකරණය
mm	
%	
hr	
w/m^2	

B) ක්ෂේත්‍රයේ බීජ හෝ පැළ සිටුවා ඒවා ප්‍රරෝහණය වී බෝගයක් ලෙස වැඩීමට සැලැස්වීම බෝග සංස්ථාපනය නම් වේ.

I. බීජ සිටුවන ගැඹුර තීරණය කිරීමට බලපාන සාධක තුනක් සඳහන් කරන්න(3X2)

1.....

2.....

3.....

II. මඩ වී වගාවේදී බීජ පෙළට සිටුවීමට යොදා ගත හැකි උපකරණයක් සඳහන් කරන්න (1X3)


.....

III. තවානේ බීජ පැළ, තවානේ නඩත්තු කිරීමේ කාලය තීරණය කිරීමට යොදා ගන්නා සාමාන්‍ය රීතිය සඳහන් කරන්න (1X3)


.....

C) ජලය එසවීමට භාවිත කරන ජල පොම්ප ආකාර දෙකක් පහත දැක්වේ.

A



B



I. A පොම්පයට සාපේක්ෂව B පොම්පය භාවිත කිරීමේ වාසි තුනක් සඳහන් කරන්න (3X3)

1.....

2.....

3.....

II. පහත අවස්ථා සඳහා යොදා ගන්නා පොම්ප ආකාර නම් කරන්න (2X4)

a) ජලවහනය දුර්වල ස්ථානයක එකතු වන ජලය ඉවත් කිරීමට යොදා ගන්නා පොම්ප ආකාරය

.....

b) විසිරි ජල සම්පාදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේදී යොදා ගන්නා ජල පොම්ප ආකාරය

.....

D) වගා භූමියක ඇති අතිරික්ත ජලය පාංශු පැතිකඩෙන් කෘත්‍රිම ක්‍රම යොදා ඉවත් කිරීම ජලවහනයයි.

I. වගා භූමියක ජලවහනය දුර්වල වූ විට බෝග ශාක වලට සහ පසට සිදුවන අහිතකර බලපෑමක් බැගින් සඳහන් කරන්න (2X3)

a) බෝග ශාකයට

.....

b) පසට


.....

II. වගා බිමක ජලවහනය දුර්වල වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න(2X2)

1. .....

2. .....

III. පහත රූපසටහනේ දැක්වෙන ජලවහන කාණු පද්ධතිය නම් කරන්න (1X3)



.....

E) බීජ මඟින් ශාක ප්‍රවාරණය බොහෝ බෝග සඳහා යොදා ගන්නා ප්‍රවාරණ ක්‍රමයකි. එහිදී බීජ සෞඛ්‍යය පිළිබඳ ව අවධානය යොමු කිරීම ඉතා වැදගත්වේ.

I. සිටුවීම සඳහා නිරෝගි බීජ ලබා ගැනීමෙන් ඇති වන වාසි දෙකක් සඳහන් කරන්න. (2X3)

1.....

2.....

II. බීජ සෞඛ්‍යයට බලපාන ප්‍රධාන පෙළඹ සාධක තුනක් නම් කරන්න. (3X3)

1.....

2.....

3.....


III. බීජ පරිහරණයට පෙර බීජ සෞඛ්‍යය පරීක්ෂා කිරීමේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න (3X3)

1.....

2.....

3.....

F) බීජ ප්‍රරෝහණය සඳහා අවශ්‍ය සාධක ප්‍රශස්තව ලබා දීමෙන් එකකාර වගාවක් ලබා ගැනීමට හැකිය.



I. මෙම රූපසටහන අදාල බීජ ප්‍රරෝහණ ආකාරය නම් කරන්න (1x2)

.....

II. එම ආකාරයේ බීජ ප්‍රරෝහණයක් දක්වන බෝග වර්ග දෙකක් නම් කරන්න(2x3)

1.....

2.....

iii. බීජ ප්‍රරෝහණය කෙරෙහි බලපාන බාහිර සාධක දෙකක් සඳහන් කරන්න (2x3)

1.....

2.....

03. A) දුෂ්පෝෂණය යනු වැරදි පෝෂණයයි. දුෂ්පෝෂණයේ ආකාර ලෙස අධිපෝෂණය හා මන්ද පෝෂණය හැදින්විය හැක.

I. මන්දපෝෂණය ඇති වීමට හේතු තුනක් සඳහන් කරන්න(3X3)

1. .....

2. .....

3. .....

II. ශ්‍රී ලංකාවේ ජනගහනය තුල දැකිය හැකි ඛණිජ ඌනතා ආකාර දෙකක් නම් කරන්න (2X3)

1. .....

2. .....

B) ආහාර අපතේ යාම අවම කර භිග කාලවලදී පරිභෝජනය ගැනීම සඳහා ආහාර පරිරක්ෂණය මෙන්ම ඒවා නිවැරදි ලෙස අසුරුම්කරණය අවශ්‍ය වේ.

I. ආහාර ඇසුරුම්කරණයේ වාසි දෙකක් දක්වන්න(2X3)

1. .....

2. .....

II. ආහාර පරිරක්ෂණය කිරීමට යොදාගන්නා කෘත්‍රිම පරිරක්ෂක දෙකක් නම් කරන්න(2X2)

1. .....

2. .....

C) ගොවි මහතෙකු බිත්තර දමන වරිගයේ වාණිජ කුකුළු ගොවිපොලක් ආරම්භ කිරීමේ අරමුණින් ඒ පිලිබඳ දැනුවත් වීම සඳහා සත්ව පාලනය පිලිබඳ ප්‍රායෝගික වැඩමුළුවක් සඳහා සහභාගී විය. එහිදී කුකුල් පාලනයේ දී සිදුකරන විවිධ ක්‍රියාකාරකම් හේතු සහිතව විස්තර කර දෙන ලදි. පහත දක්වා ඇත්තේ එවැනි ක්‍රියාකාරකම් කිහිපයකි. එම ක්‍රියාකාරකම් සිදු කිරීමට හේතුව සඳහන් කරන්න. (5X4)

I. දිනයක් වයසැති කිකිළි පැටවුන් බෲඩරයට හදුන්වා දෙන මුල් දිනයේ උණුකර නිවාගත් මද උණුසුම් ජලයට විටමින් B12 සහ ග්ලූකෝස් මිශ්‍ර කර බීමට දීම.

.....

II. බෘඩරය තුල මුල් දින 3 -4 කඩදාසි අතුරුණුවක් මත පැටවුන් ඇති කිරීම.

.....

III. කුඩා පැටවුන්ට සති 4 – 6 කාලය තුලදී හොට කෙටි කිරීමේ උපකරණයක් භාවිත කර හොටෙහි කුඩා කොටසක් කපා දැමීම.

.....


IV. සති 14 සිට සති 18 අතර දක්වා ආලෝකය පාලනය කිරීම මගින් දිනකට ආලෝක පැය 16 කට නිරාවරණය කිරීම

.....

V. සති 18 දී බිත්තර දැමීම ආරම්භ කිරීමත් සමග සිප්පි කටු කැබලි ආහාරයට එකතු කරයි.

.....

D) ගොවිපොළ සතුන්ගේ ආහාර ජීර්ණ පද්ධතිය පේශිමය හ ග්‍රන්ථීමය පටකයන්ගෙන් යුක්ත වන අතර සත්ව විශේෂ ඔවුන් ගන්නා ආහාර අනුව නොයෙකුත් කොටස් වල වෙනස්කම් පවති.



I. ඉහත දක්වා ඇති ගවයකුගේ සංකීර්ණ ආමාශයේ A, B, C, D කොටස් නම් කරන්න (4X2)

A .....

B .....

C .....

D .....

II. ඉහත A හා B කොටස් දෙක අතර ඇති ව්‍යුහමය හා කෘත්‍යමය වෙනස්කමක් බැගින් සඳහන් කරන්න(2X3)

1. ව්‍යුහාත්මක .....

.....

2. කෘත්‍යාමය .....

.....

III. ගවයකුගේ ආහාර ජීර්ණ පද්ධතිය තුල පහත පෝෂක ජීර්ණ වන ප්‍රධාන ස්ථාන නම් කරන්න(3X2)

a) සෙලියුලෝස් .....

b) ක්ෂුද්‍ර ජීවී ප්‍රෝටීන .....

c) පිෂ්ඨය .....


E) ගව දෙනකුගේ කිරි මුදාහැරීමේ ක්‍රියාවලියේ පියවර සහිත ප්‍රකාශන, නිසි අනුපිලිවළින් තොරව පහත දක්වා ඇත. (5X3)

A. හයිපොතැලමසෙහි සිට අපර පිටියුටරියට ස්නායු පණිවිඩයක් ලැබීම.
B. සුදුසු බාහිර උත්තේජනයක් ලැබීම.
C. ගර්භනික බිත්ති සංකෝචනය වී, ඒ තුල තිබූ කිරි ප්‍රනාල වල සිට ග්‍රන්ථි වරාසයට පැමිණීම.
D. ක්ෂරය පුඩු වරාසයට පැමිණීම.
E. ඔක්සිටොසින් හොර්මෝනය ස්‍රාවය වීම

ඉහත ක්‍රියාමාර්ග නිවැරදි අනුපිලිවෙළින් සකස් කරන්න

1. .....
2. .....
3. .....
4. .....
5. .....

F) පහත දැක්වෙන්නේ බෝග වගාවේ දී පරිසර තත්ව පාලනය සඳහා යොදා ගන්නා ආරක්ෂිත ව්‍යුහයකි.



I. ඉහත ආරක්ෂිත ව්‍යුහය වර්ගීකරණයේ කුමන කාණ්ඩයකට අයත් වේද? (1x3)

.....

II. මෙම ආරක්ෂිත ව්‍යුහය භාවිතයේ මූලික අරමුණ සඳහන් කරන්න(1x3)

.....

G) නිර්පාංශු වගාවේ දී පස රහිතව බෝග වගාවන් සිදු කරන නිසා සියලුම පෝෂක සහිත ද්‍රාවණයක් ඒ සඳහා යොදා ගනියි. මෙලෙස යොදා ගන්නා පෝෂක ද්‍රාවණය සකස් කර අවසානයේ pH අගය සහ EC අගය මැනීමේදී පහත දත්ත ලැබුණි නම් ගොවි මහතා එය නිවැරදි කිරීමට සිදු කල යුතු ක්‍රියාකරකමක් සඳහන් කරන්න

I. pH අගය 4.8 වීම (1x4)

.....

II. EC අගය 3ds/m වීම (1x 4)

.....

III. නිර්පාංශු වගාවේ බහුලව යොදා ගන්නා පෝෂක මාධ්‍යක් නම් කරන්න (1x3)

.....

H) පුද්ගලයන්ට උපද්‍රවයක් ඇති කිරීමට විභවතාවක් ඇති ඔනෑම දෙයක් ආපදාවක් වේ. කෘෂිකර්මාන්තයේ නියෙලෙන ගොවින් විවිධ ආපදා වලට ලක් වේ.

I. කෘෂි ක්ෂේත්‍රයක අධික උෂ්ණත්වයක් යටතේ කාර්යයන් වල නිරත ගොවීන්ට ඇති විය හැකි ආපදා තත්ව දෙකක් සඳහන් කරන්න (2x2)

1.....


2.....

II. කෘෂි රසායන ද්‍රව්‍ය ගොවීන් ශරීරගත විය හැකි ආකාර දෙකක් දක්වන්න (2x2)

1.....

2.....

04. A) පහත දක්වා ඇත්තේ රෝග හඳුනා ගැනීම හා පාලනය සඳහා යොදා ගන්නා රෝග ත්‍රිකෝණයකි.



I. මෙහි A සහ B සංරචක නම් කරන්න (2X2)

A. .....

B. .....

II. බෝග ශාක වලට හානි කරන වටපණුවන්ගේ හානිය නිසා ඇති වන රෝග ලක්ෂණයක් සඳහන් කරන්න (1X2)

.....

B) නෙළු අස්වනු පරිභෝජනය කරනතුරු අස්වැන්නට සිදුවන හානි නිසා අස්වැන්නේ වැඩි කොටස් අපතේ යෑම සිදුවේ.

I. පසු අස්වනු හානි කෙරෙහි බලපාන පෙර අස්වනු සාධක දෙකක් සඳහන් කරන්න. (2X3)

1. .....

2. .....

II. ප්‍රවාහනයේ දී පසු අස්වනු හානි බහුලව සිදුවන බැවින් එම හානි වැලැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න(2X3)

1. .....

2. .....

III. පසු අස්වනු හානි අවම කර ගැනීම සඳහා අඹ සහ දොඩම් වල අස්වනු නෙලීම වඩාත් සුදුසු දවසේ වේලාව සඳහන් කරන්න (1X3)

.....

C) බෝග වගාවේදී ක්ෂේත්‍රයේ පලිබෝධ ගහනය ආර්ථික හානිදායකින් තොරව පවත්වා ගැනීමට විවිධ පලිබෝධ පාලන ක්‍රම අනුගමනය කරයි. පහත දක්වා ඇති ක්‍රියාකාරකම් අනුව ඒ සඳහා යොදා ගන්නා ප්‍රධාන පලිබෝධ පාලන ක්‍රමය නම් කරන්න (4X4)

I. බෝග වගාවක් සිටින ගොලුබෙල්ලන් අතින් එකතු කර ක්ෂේත්‍රයෙන් ඉවත් කරයි.

.....

II. බෝග වගාවක සිටින කෘමී පලිබෝධකයින්ගේ පිරිමි සතුන්ව හොර්මෝන භාවිත කර වදහාවයට පත් කර එම ක්ෂේත්‍රයට මුදා හැරීම.

.....


III. පසේ සිටින පලිබෝධකයකුගේ ජීවන චක්‍රයේ අවස්ථාවන් විනාශ කිරීම සඳහා බිම කොටා පෙරලා පස මතුපිටට ගැනීම මගින් ආලෝකයට නිරාවරණය කිරීම.

.....


IV. බෝග වගාවකට අවශ්‍ය කුඩා පැල ලබාගැනීමට සකසන තවාන් මිශ්‍රණයට දිලිරනාශකයක් යොදා හොඳින් මිශ්‍ර කිරීම.

.....

D) පහත රූපසටහන් වල පෙන්වා ඇත්තේ බෝග වගාවට බහුලව හානි කරන වල් පැළෑටි කිහිපයකි.



A



B



C

I. රූපීය ලක්ෂණ අනුව එම වල්පැළෑටි වර්ග කර උදාහරණය බැගින් සඳහන් කරන්න(6X2)

A. ....

B. ....

C. ....

II. ශ්‍රී ලංකාවේ බහුලව හමුවන ආගන්තුක ආක්‍රමණශීලී වල්පැළෑටියක් නම් කරන්න (1X2)

1. .....


2. .....

III. ආගන්තුක ආක්‍රමණශීලී වල්පැළෑටි තම පැවැත්ම තහවුරු කිරීමට දක්වන අනුවර්තන දෙකක් නම් කරන්න (2X2)

1. .....

2. .....

E) ගොවි මහතෙකුගේ අක්කර දහයක් පමණ වූ තම පොල් ඉඩමේ නව ගොවිපොළක් ආරම්භ කිරීමට තීරණය කර තම නිවසද ඇතුලත්ව සකස් කල දළ භූමි සටහනක් පහත දැක්වේ.



I. ඉහත දල භූමි සටහනට අනුව එම වගා පද්ධතිය කුමන ගොවිතැන් ක්‍රමයට අයත් වේද? (1X3)

.....

II. ඉහත ගොවිතැන් ක්‍රමයට අනුව A ලෙස නම් කර ඇති අනිවාර්ය අංගය නම් කරන්න (1X3)

.....

III. මෙම ගොවිතැන් ක්‍රමය තුල බෝග වගා කිරීමේ දී භාවිත කල හැකි බහු බෝග වගා ක්‍රම දෙකක් නම් කරන්න (2X3)

1. .....

2. .....


IV. මෙම ගොවිතැන් ක්‍රමයේ ප්‍රධාන වාසියක් සඳහන් කරන්න(1X3)

.....

F) බඩ ඉරිගු වගාවක පිරිවැය පහත වගුවේ දක්වා ඇත. එහි ඇති හිස්තැන් පුරවන්න. (10x1.5)

නිෂ්පාදන	මුළු ස්ථාවර පිරිවැය	මුළු විචල්‍ය පිරිවැය	සමාන්‍ය ස්ථාවර පිරිවැය	සමාන්‍ය විචල්‍ය පිරිවැය	මුළු පිරිවැය	සාමාන්‍ය මුළු පිරිවැය	ආන්තික පිරිවැය
1	.....	10	10	10	.....	.....	20
2	10	.....	.....	15	.....	20	.....
3	10	.....	3.33	.....	55	.....	15

G) වී වගාවේ දැකිය හැකි අගය දාමය පහත දැක්වේ.



I. මෙම අගය දාමයේ හිස්තැන් පුරවන්න (5x2)

A. .....

B. .....

C. .....

D. .....

E. .....

II. සුළු පරිමාණ කෘෂි ව්‍යාපාරයක බාහිර පරීසරයට අයත් සංරවක දෙකක් සඳහන් කරන්න (2x3)

1.....

2.....

III. කෘෂි ව්‍යාපාර සඳහා ව්‍යාපාර සැලැස්මක් සැකසීමේ වැදගත්කමක් සඳහන් කරන්න(1x2)

.....

B කොටස

